www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# තෙවන පාර්ශ්ව උද්ඝෝෂනයන්ට එරෙහි ඩිමොක්‍රැටික් පක්ෂ ප්‍රහාර නවතනු! සසප අපේක්ෂක ටොම් මැකමන්ට ඉලිනොයිස් මැතිවරනය සඳහා ඉදිරිපත් වීමට අවස්ථාව සලසනු!

**Stop the Democratic Party's attack on third-party campaigns!**
**Place SEP candidate Tom Mackaman on the ballot in Illinois!**

**සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රකාශය**
**2004 ජුලි 08**

නොවැම්බර් මැතිවරනයේ දී ප්‍රාන්ත නියෝජිත ධුරයකට තරග වදින සමාජවාදී සමානතා පක්ෂ (සසප) අපේක්ෂක ටොම් මැකමන් එම ඡන්දයෙන් ඉවත කර තැබීම සඳහා දැරෙන ප්‍රයත්නයන්ට එරෙහිව ඉලිනොයිස්හි ෂැම්පේන් උපප්‍රාන්ත (County) ලේකම් කාර්යාලය පිරී ඉතිරී යන විරෝධතා ලිපි ගංගාවක් නිර්මානය කරන ලෙස එක්සත් ජනපදය තුල සහ ලොව පුරා සිටින හිතවතුන්ගෙන් සහ ප්‍රජාතාන්ත්‍රිය අයිතීන් සුරකින සියලු දෙනාගෙන් සසපය ඉල්ලා සිටී. ඩිමොක්‍රැටික් හා රිපබ්ලිකන් පක්ෂවල ප්‍රජාතන්ත්‍ර විරෝධී අභියෝගයන් පරාජය කිරීමට බලාපොරොත්තු වන තෙවන පාර්ශ්වකරුවන්ගෙන් සසපය ඉල්ලා සිටින්නේ ඒකාබද්ධ ක්‍රියා මාර්ගයන්ට එලඹෙන ලෙස යි.

මැකමන් හා ඔහුගේ හිතවතුන් ඉදිරිපත් කල -- ස්වාධීන අපේක්ෂකයකු ලෙස ඡන්ද අපේක්ෂකත්වයට සුදුසුකම් ලැබීමට අවශ්‍ය 1,344ක අත්සන් ප්‍රමානයට බොහෝ සෙයින් ඉහල 2,032ක අත්සන් ප්‍රමානයක් අඩංගු වූ -- අත්සන් පත්‍රවලට එරෙහිව ඉලිනොයිසයේ ඩිමොක්‍රැටික් පක්ෂ නිලධාරීන් විරෝධතාවක් මතු කර ඇත. සසප අපේක්ෂකයා ඉලිනොයිස්හි නැගෙනහිර-මැද පලාතේ ෂැම්පේන් අර්බනාහි ඉලිනොයිස් නියෝජිත මන්ත්‍රී මන්ඩලයේ 103 වන දිස්ත්‍රික්කයේ ආසනයක් සඳහා ඩිමොක්‍රැටික නයෝමි ජේකබ්සන්ට ද ඇගේ ප්‍රතිවාදී රිපබ්ලිකන් අපේක්ෂකයාට ද එරෙහිව තරග වදී.

මැකමන් සහ සසප නියෝජිතයන් ජුලි 6 වන දා උදේ 10ට ෂැම්පේන් උපප්‍රාන්ත උසාවියේ ''කේ'' උසාවි පරිශ්‍රයේ දී සිය අපේක්ෂකත්වයට ඩිමොක්‍රැටික් පක්ෂය ගෙන ආ විරෝධය අභියෝගයට ලක් කර ප්‍රාදේශීය බල මන්ඩලයේ තීන්දුවට එරෙහිව අධිකරන විමර්ශනයක් සඳහා දින 10ක් ඇතුලත මාන්ඩලික උසාවි අධ්‍යක්ෂවරයාට පැමිනිලි කිරීමට අපේක්ෂකයාට හෝ විරෝධතා දැක්වූවන්ට හැකි වේ.

අපගේ අපේක්ෂකයා ඡන්දයෙන් ඉවත් කර තැබීමට ඩිමොක්‍රැටික් පක්ෂය ගන්නා ප්‍රයත්නයන් ප්‍රතික්ෂේප කරන ලෙස ඉල්ලමින් ෂැම්පේන් උපප්‍රාන්තයේ මැතිවරන බල මන්ඩලයට ඊ-මේල් පනිවුඩ යවන මෙන් සසපය ඉල්ලා සිටී. ඊ-මේල් පනිවුඩ යැවිය යුතු වනුයේ ෂැම්පේන් උපප්‍රාන්ත ලේකම් මාක් ෂෙල්ඩන්ගේ කාර්යාලයට වන අතර එහි ලිපිනය මෙසේ ය: *mail@champaigncountyclerk.com*

කරුනාකර ඊ-මේල් පනිවුඩ පිටපත් *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* එවන්න: *editor@wsws.org*

විරෝධතාකරුගේ පෙත්සම ඉදිරිපත් කර තිබෙන්නේ ෂැම්පේන් උපප්‍රාන්ත ඩිමොක්‍රැටික් පක්ෂයේ වර්තමාන භාන්ඩාගාරික සහ හිටපු සභාපති ජෙරල්ඩීන් පාර් විසිනි. සසප සාමාජිකයන් රැස් කල සම්පූර්න අත්සන් ප්‍රමානයෙන් අඩකටත් වඩා වැඩි 1,021ක අත්සන් ප්‍රමානයක් වලංගු නො වන බව ඉන් කියා පායි. මෙම චෝදනාවට කිසිදු සාධකමය හෝ නීතිමය පදනමක් ඇත්තේ නැත. ඒ වෙනුවට මෙහි තිබෙන්නේ, සමහරක් අත්සන් එකට බැඳුනු වැල් අකුරුවලින් නො ව තනි අකුරුවලින් ඇති නිසා වලංගු නැත, හෝ ''ලිපිනයන් සම්පූර්නයෙන් ම නැත, නැත හොත් කොටසක් අඩු ය''(නවාතැන් කාමරයේ අංකය නැති වීම බඳු සුලු දේ) යන කියා පෑම්වලින් යුතු තාක්ෂනික ලේශමාත්‍රයන් යැදීමකි.

අභියෝගයට ලක් වූ අත්සන් අතුරින් සියයට 80-90කට බලපාන ප්‍රධාන චෝදනාව වනුයේ අත්සන් තැබූ අය එක් ලිපිනයක ලියාපදිංචිව වෙනත් ලිපිනයක සිට අත්සන් තැබීම යි. මිනිසුන් තමන් පදිංචි ස්ථානය නිතර වෙනස් කරන, විශාල ශිෂ්‍ය ප්‍රජාවක් වෙසෙන

ප්‍රදේශයක මෙය සාමාන්‍ය සිදුවීමක් වන අතර ෂැම්පේන් ප්‍රදේශයට ඉලිනොයිස් විශ්වවිද්‍යාල භූමිය ඇතුලත් වේ. ඩිමොක්‍රැටිකයන් සිය අභියෝගයේ පදනම ලෙස මෙම චෝදනාව ඉදිරිපත් කිරීම තරුන ශිෂ්‍යයන්ගේ ප්‍රජාතාන්ත්‍රීය අයිතීන්ට ඔවුන්ගේ ඇති දෘඪතර වෛරය ප්‍රකට කරයි.

''ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හෝ වෙනත් නියමිත නිලධරයකු ඉදිරියේ දිවුරුම් නො දුන්, බෙදා හරින්නන්ගේ දිවුරුම් ප්‍රකාශ අත්සන් පත්‍රිකාවල'' වන අතර ''එම නිසා පත්‍රිකාවල සියලු ම අත්සන් අවලංගු වේ'' යැයි කියා පාමින් විරෝධතාවය බොරු තොග ගනනේ නිර්මානය කරයි. සත්තකින් ම, පත්‍රිකා 105 ම බෙදා හරින්නන් අත්සන් තබා නොතාරිස් සහතිකය ලබා ඇත.

සසප ඉල්ලුම් පත්‍රය කෙරෙහි ඩිමොක්‍රැටික් පක්ෂයේ විරෝධය ප්‍රජාතන්ත්‍ර විරෝධී වනවා පමනක් නො ව ඉහවහා ගිය නිවටකමක් ද වෙයි. කිසිදු ඇඟිලි සලකුනක් නො තබා තම වැඩේ කිරීමට බලාපොරොත්තු වන වසවිස මුසු කරන්නකුගේ හෝ සොරකු ගේ හැසිරීමක් මෙහි දී සිදු වෙයි. මෙම අභියෝගය ඉදිරිපත් කිරීමේ දී ජේකබ්සන්ගේ සම්බන්ධයක් නැතැයි පැවසුව ද, ප්‍රාන්ත නියෝජිත ජේකබ්සන්ගේ දිසා කාර්යාලයේ ප්‍රකාශිකාවක මෙය පදනම්ව තිබෙන්නේ එලිසබෙත් බ්‍රවුන් සහ බ්‍රෙන්ඩන් හොස්ටෙට්ලර් නම් ඉලිනොසිස් නියෝජිත මන්ත්‍රී මන්ඩලයේ රාජ්‍ය වැටුප් ලබන ඩිමොක්‍රැටික් පක්ෂ මාන්ඩලිකයන් දෙදෙනකු මැකමන්ගේ අත්සන් පත්‍ර පරීක්ෂාවෙන් ලද කරුනු මත ය. *ලෝක සමාජවාදී වෙබ් අඩවි* වාර්තාකරුවකු විසින් විමසූ කල බ්‍රවුන් සහ හොස්ටෙට්ලර් යන දෙදෙනා ම කියා සිටියේ තමන් ක්‍රියා කලේ ''පුද්ගලිකව පුරවැසියන්'' යි කියමින් ලෙස මිස ඩිමොක්‍රැටික් පක්ෂයේ නියෝජිතයන් ලෙස නො වන බව වුව ද, ''මම මගේ මිතුරියට උදව් කිරීමට වෑයම් කරමි'' යි කියමින් ජේකබ්සන් තම මිතුරියකැයි හොස්ටෙට්ලර් විස්තර කලේ ය.

ඉලිනොයිස්හි සසපයට ඇති අභියෝගය හුදෙකලා වූවක් හෝ විශ්මය දනවන්නක් නො වේ. එය ඉලිනොයිස්හි පමනක් නො ව සමස්ත එක්සත් ජනපදය පුරා ම තෙවන පාර්ශ්ව මැතිවරන ව්‍යාපාර මර්දනය කිරීමට ඩිමොක්‍රැටිකයන් සාමූහිකව ගත් වෑයමක කොටසකි. ඉලිනොයිසයේ පමනක් හරිත පක්ෂයේ ස්වාධීන ජනාධිපති අපේක්ෂක රැල්ෆ් නාඩර් සහ අනෙකුත් හරිත අපේක්ෂකයන්, ලිබටේරියන් අපේක්ෂකයන් සහ අනෙකුත් ස්වාධීන තරගකරුවන් ඇතුලු විසි ගනනක් අපේක්ෂකයන්ගේ අත්සන් පත්‍රයන්ට එරෙහිව ඩිමොක්‍රැටික් හා රිපබ්ලිකන් ක්‍රියාධරයන් විරෝධතා මතු කර ඇත.

ජාතික මට්ටමේ දී, ඇරිසෝනාවේ නාඩර්ගේ අත්සන් පත්‍රයට විරෝධතා ගොනු කරමින් ද නාඩර්ගේ ආධාරකරුවන් ඔහු ඡන්ද පත්‍රිකාවට ඇතුලත් කිරීම වලක්වා ලීමේ වෑයමක් ලෙස නාම යෝජනා සමුලුවට කුලියට ගත් ඔරෙගන්හි ශාලාවක් තමන්ගේ ආධාරකරුවන්ගෙන් පුරවමින් ද, නාඩර්ගේ මැතිවරන ව්‍යාපාරය අවුල් කර දැමීමට වන සැලසුම් සහගත ප්‍රයත්නයක ඩිමොක්‍රැටික් පක්ෂය නියැලී සිටී.

මෙම ප්‍රජාතන්ත්‍ර විරෝධී උපක්‍රම ඩිමොක්‍රැටික් පක්ෂයේ ඉහල ම තට්ටුවලින් අනුමැතිය ලබයි. ඩිමොක්‍රැටික් ජාතික කමිටුවේ ප්‍රකාශකයකු වන ජාහෝ කැබ්රේරා ජූනි 30 වන දා *නිව් යෝක් ටයිම්ස්* පුවත්පතට මෙසේ පැවසී ය: ''රැල්ෆ් නාඩර් රැස් කල අත්සන්වල වලංගු භාවය පිලිබඳව එක් එක් ප්‍රාන්ත පක්ෂ අභියෝග කරන බව අපි දනිමු .... අපි මෙම ප්‍රයත්නයන්ට සහාය දෙමු.''

ද්වි පක්ෂ ක්‍රමයට එරෙහි කිසියම් හෝ මැතිවරන විකල්පයක් මතු වීම මර්දනය කිරීමේ අභිලාෂයට වැඩි, එනම් පවතින සැටියෙන් ම ප්‍රතිගාමී හා ප්‍රජාතන්ත්‍ර විරෝධී වන යමක් ප්‍රාන්ත සහ ප්‍රාදේශීය ඩිමොක්‍රැටිකයන්ගේ ක්‍රියාකාරකම්වලින් ප්‍රකාශයට පත් වෙයි. වඩාත් අතිමූලිකව ගත් විට, 2004 මැතිවරනය තුල වැදගත් ම දේශපාලන කරුනු පිලිබඳව යම් හෝ දේශපාලන සාකච්ඡාවක් ඇති වීම අහුරා දැමීමේ මංමුලා සහගත වෑයමක ඩිමොක්‍රැටික් පක්ෂය නිරතව සිටී. එම කාරනා නම්, ඩිමොක්‍රැටිකයන් හා රිපබ්ලිකානුවන් එක ම ස්ථාවරයක් ගන්නා ඉරාක යුද්ධය සහ ප්‍රජාතන්ත්‍ර අයිතීන් හා ජීවන තත්වයන් මත දැනට සිදු වන ප්‍රහාරයන් ය.

රිපබ්ලිකානුවන්ට හෝ බුෂ්ගේ යලි තේරී පත්වීමේ ව්‍යාපාරයට නො ව, ඉරාකයේ යුද්ධයට විරුද්ධ වන්නන්ගේ ඡන්දවලට ඒ හෝ මේ ආකාරයෙන් ආයාචනය කරන, විශේෂයෙන් ම සසපය, හරිතයන් සහ නාඩර් වැනි තෙවන පාර්ශ්ව අපේක්ෂකයන්ට පහර දීමට ඩිමොක්‍රැටික් පක්ෂය ගත් තීන්දුවේ ප්‍රගාඪ දේශපාලන අර්ථභාරයක් පවතී.

2000 මැතිවරනයේ දී, රිපබ්ලිකන් පක්ෂය ෆ්ලොරිඩාවේ ඡන්ද පාගා දැමීමෙන් පසුව, යලි ගනන් කිරීම වැලැක්වීමට තර්ජන හා බිය වැද්දීම් සිදු කිරීමෙන් පසුව සහ අවසානයේ ශ්‍රේෂ්ඨාධිකරනයේ මැදිහත් වීමෙන් පසුව ඩිමොක්‍රැටික් පක්ෂය සහ ගෝර්ගේ මැතිවරන ව්‍යාපාරය දක්ෂිනාංශයේ මැතිවරන කොල්ලයට යටත් විය. ඒ අවස්ථාවේ දී, මෙම යටත්වීම සහ සංගත-පාලිත මාධ්‍ය මගින් ඊට අනුමැතිය දීම පෙන්නුම් කලේ, ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කිරීම සඳහා ඇමරිකානු පාලක ප්‍රභූව තුල සැලකිය යුතු තරමේ කන්ඩායමක් නො පවතින බව ය යි සසපය අනතුරු ඇඟවී ය.

සිව් වසරකට පසු, ප්‍රජාතාන්ත්‍රීය සහ ඡන්ද අයිතීන්ට පහර දීමේ රිපබ්ලිකානු කලාව අනුකරනය කිරීමට ඩිමොක්‍රැටික් පක්ෂය තීරනය කර තිබේ. රිපබ්ලිකානුවන් ෆ්ලොරිඩාවේ දී ගෝර්ට වැටුන සුජාත වූ ඡන්ද ගනන් කිරීම වැලැක්වීමට මාන බැලූ ආකාරයට ම ඩිමොක්‍රැටිකයෝ රැල්ෆ් නාඩර්ගේ සහ අනෙකුත් ස්වාධීන අපේක්ෂකයන්ගේ ද ඉලිනොයිසියේ සසප

අපේක්ෂක ටොම් මැකමන්ගේ ද සුජාත වූ අත්සන් ගනන් කිරීම වැලැක්වීමට මාන බලති. අනෙක් ප්‍රාන්තවල සසප අපේක්ෂකයන්ට ද මේ ආකාරයේ ම ප්‍රජාතන්ත්‍ර විරෝධී ප්‍රහාරයන්ට මුහුන දීමට සිදු වනු ඇති බවට සැකයක් නැත.

ඇමරිකානු පාලක ප්‍රභුව පැත්තෙන් සලකන කල්හි කෙරීගේ ඡන්ද ව්‍යාපාරයේ ප්‍රධාන කටයුත්ත වන්නේ, 2004 මැතිවරනයේ නිල සංවාදවලින් ඉරාක යුද්ධයේ සුජාත භාවයට කෙරෙන ඕනෑ ම අභියෝගයක් පිටුදැකීම ය. ඇමරිකානු ජනගහනයෙන් බහුතරය ඉරාක යුද්ධයට විරුද්ධ බවත් ඇමරිකානු හමුදා වහා ම ඉවත් කර ගැනීමකට සියයට 40ක් කැමැත්ත දක්වන බවත් ජනමත විමසුම් පෙන්නුම් කරයි. වත්කම් සහ ජීවිතවල වන්දිය කෙතරම් වුව ද ඇමරිකානු වාඩි ලා ගැනීම සහ ඉරාක විරෝධය මර්දනය කිරීම දිගට ම කිරීමට දිවුරා සිටින ප්‍රකෝටිපති දේශපාලනඥයන් දෙදෙනා වන බුෂ් සහ කෙරී අතර තරගයේ දී මෙම කෝටි ගනන් වන ජනයා මුලුමනින් ම නියෝජනයකින් තොරව සිටිති.

සසප මැතිවරන ව්‍යාපාරය නො වැලැක්විය හැකි පරිදි ම දේශපාලන වාරනයේ ඉලක්කයක් බවට පත් වේ. මක් නිසා ද යත්, අපගේ ජනාධිපති අපේක්ෂකයන් වන බිල් වැන් ඕකන් සහ ජිම් ලෝරන්ස් ද ටොම් මැකමන් වැනි කොංග්‍රස් සහ නියෝජිත මන්ත්‍රන සභා අපේක්ෂකයන් ද ඔවුන්ගේ මැතිවරන ව්‍යාපාරයේ හරි මැද ඉරාකයේ යුද්ධය පිහිටුවා ඇති හෙයිනි. ඉරාකයෙන් ඇමරිකානු සහ අනෙකුත් විදේශ හමුදා වහා ම කොන්දේසි විරහිතව ඉවත් කිරීම, ඉරාක ජනයාට තමන්ගේ රට යලි ගොඩ නගා ගැනීමට හැකි වන අයුරු වන්දි ගෙවීම සහ දැනට මත් දසදහස් ගනන් ජීවිත මිලක් ගෙවා ඇති මෙම ආක්‍රමනයේ සහ දිග්විජයේ අතිදුෂ්ට ක්‍රියාවට වගකිව යුතු ඇමරිකානු නිලධරයන් විනිශ්චය කිරීමට යුද අපරාධ අධිකරනයක් පිහිටුවන ලෙස අපි ඉල්ලා සිටිමු.

ඉරාකයේ යුද්ධයට විරුද්ධ වන්නා වූ ද කෙරීගේ සහ ඩිමොක්‍රැටිකයන්ගේ යුද්ධයට පක්ෂපාතී දේශපාලනයෙන් සහ ප්‍රජාතන්ත්‍ර විරෝධී විධික්‍රමයන්ගෙන් කෝපයට පත්ව සිටින්නා වූ ද සියලු ම දෙනාගෙන් නොවැම්බර් මැතිවරනයෙන් යුද විරෝධී අපේක්ෂකයන් ඉවත් කර තැබීම සඳහා දැරෙන ප්‍රයත්නයන්ට එරෙහිව තම විරෝධතාවේ හඬ එක් කරන මෙන් අපි බලවත් උනන්දුවෙන් යුතුව ඉල්ලා සිටිමු.

සියලු විරෝධතා ලිපි ෂැම්පේන් උපප්‍රාන්ත ලේකම් මාක් ෂෙල්ඩන්ගේ කාර්යාලයට යොමු කරන්න.

ඊ-මේල් ලිපිනය: mail@champaigncountyclerk.com

විරෝධතා ලිපිවල පිටපත් *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* යොමු කරන්න.

ඊ-මේල් ලිපිනය: editor@wsws.org

© www.wsws.org